මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.05.12

ඩී. කුංචනා ඉෂානි ලොකුකැටගොඩ
20/3, තානායම පාර,
රත්නපුර.

**පැමිණිලිකාර පාර්ශවය**

ඒ.ජී. ජානක කිත්සිරි

**වින්දිත පාර්ශවය**

01. ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි
මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක (විශ්‍රාමික)
පොලිස් ස්ථානය, රත්නපුර.
(පෞද්ගලික ලිපිනය:
නො.09, වැලිකන්න, වග)

02. උ.පො.ප ඔබේසේකර
පොලිස් ස්ථානය, රත්නපුර.
(වර්තමාන සේවා ස්ථානය:
පොලිස් ස්ථානය, අයගම)

03. පො.කො 54287 ළහිරු
පොලිස් ස්ථානය, රත්නපුර.
(වර්තමාන සේවා ස්ථානය:
පොලිස් ස්ථානය, මීගොඩ)

04. පො.සැ.35072 රුවන්
පොලිස් ස්ථානය, රත්නපුර.

**වගඋත්තරකාර පාර්ශවය**

<u>පැමිණිලි අංකය : **HRC/RAT/107/24**</u>

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම.</u>**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් 2024.08.12 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර සිටින්නේ, 2024.07.16 වන දින සිදු වූ ආරවුලකදී තම ස්වාමි පුරුෂයා වන ඒ.ජී. ජානක කිත්සිරි (වින්දිත පාර්ශවය) විසින් වෙනත් පාර්ශවයක් වෙත කරන ලද පහරදීමක් හේතුවෙන් එම පාර්ශවය රෝහල්ගත වී ඇති බවත්, ඒ අනුව

තමා 2024.07.26 දින තම ස්වාමිපුරුෂයා සම්බන්ධව රත්නපුර අධිකරණය හරහා අපේක්ෂිත ඇපයක් ගොනු කළ බවත් ය.

පසුව 2024.07.27 දින සවස 4.30ට පමණ තමා හා තම ස්වාමි පුරුෂයා දරු දෙදෙනා සමඟ නිවසේ සිටිය දී සිවිල් ඇඳුමින් සැරසුණු පුද්ගලයන් දෙදෙනකු යතුරු පැදියකින් නිවසට පැමිණි බවත්, එසේ පැමිණි පුද්ගලයින් තමාගේ ස්වාමි පුරුෂයාගේ නම කියා ඔහුව විමසා සිටි බවත්, ඔවුන් කවුරුන්දැයි තමා විමසා සිටි නමුත්, ඔවුන් සිය අනන්‍යතාවය හෙළි නොකළ බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. එලෙස පැමිණි පුද්ගලයන් තම ස්වාමි පුරුෂයා සම්බන්ධයෙන් සිදු කළ විමසීම ඇසී නිවස තුළ සිටි ස්වාමි පුරුෂයා බිත්තියකින් පිටතට පැන දිව ගිය බවත්, නිවසට පැමිණි පුද්ගලයන් දෙදෙනා ස්වාමි පුරුෂයා ලුහුබැඳ ගිය බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත. එලෙස ලුහුබැඳ ගොස් එම පුද්ගලයන් දෙදෙනා විසින් තම ස්වාමි පුරුෂයා අල්ලාගෙන පහර දුන් බවත්, එය තමාගේ හත් හැවිරිදි දියණිය දැක "අම්මේ තාත්තාට ගහනවා" ලෙස කෑ ගැසූ බවත්, ඉන්පසු එම පුද්ගලයන් දෙදෙනා ස්වාමි පුරුෂයාගේ කකුල් පාගා ඇති බවත්, ස්වාමි පුරුෂයාගේ සහෝදරයින් එම ස්ථානයට පැමිණි බවත්, එවිට ස්වාමි පුරුෂයා විසින් පැමිණ සිටි පුද්ගලයන් දෙදෙනා පෙන්වා "මුං මගේ කකුල් දෙක කැඩුවා" යැයි පැවසූ බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

එසේම, එහිදී දෙපාර්ශවය අතර වචන හුවමාරුවක් සිදු වූ බවත්, අනතුරුව පොලිස් නිලධාරීන් 12 දෙනෙකු පමණ එම ස්ථානයට පැමිණි බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. එසේ පැමිණි පිරිස පැමිණිලිකාරිය පදිංචි නිවස හා ස්වාමි පුරුෂයාගේ මහ ගෙදර ඇතුළට ගොස් පරික්ෂා කළ බවත්, එහි දී ස්වාමි පුරුෂයා පුද්ගලයෙකුට පහර දී බරපතල තුවාල සිදු කිරීමේ චෝදනාව සම්බන්ධව එදිනම එනම්, 2024.07.27 දින සවස 6.00ට පමණ පැමිණිලිකාර පාර්ශවයට අයත් මෝටර් රථයෙන්ම රත්නපුර පොලිස් ස්ථානය වෙත ස්වාමි පුරුෂයා රැගෙන ගොස් භාර දුන් බවත්, එහිදී පොලිස් පොත්වල සටහන් කර ගැනීමෙන් පසු ස්වාමි පුරුෂයා රෝහල වෙත රැගෙන යන බව පොලිස් නිලධාරීන් ප්‍රකාශ කර සිටි බවත් පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එහෙත් ඊට පසු දින එනම්, 2024.07.28 වන දින පෙ.ව. 6.30 පමණ වන විට පැමිණිලිකාරිය පොලිස් ස්ථානය වෙත යන විටත් තම ස්වාමි පුරුෂයා රෝහල්ගත කර නොතිබුණු බවත්, ස්වාමි පුරුෂයාගේ දෙපා ඉදිමී තිබූ බවත්, කිසිදු ප්‍රතිකාරයක් සඳහා යොමු කර නොමැති බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. පසුව එදින පෙ.ව 11.00 ට පමණ ස්වාමි පුරුෂයා රෝහල් ගත කර ඇති අතර, රෝහල් ගත කිරීමට රැගෙන ගිය ළහිරු නමැති නිලධාරියා "උඹ මේ වැඩේදි අපට කරදර නොකෙරුවොත් අපෙනුත් උඹට කරදරයක් නෑ. නැත්තම් උඹලගේ පවුල්වල අයිස්, ආයුධ තිබුණා කියලා බන්ධනාගාරගත කරනවා" යනුවෙන් ස්වාමි පුරුෂයා හට තර්ජනය කර ඇති බවත්, ඒ හේතුව නිසා රෝහල් ගත කිරීමේ දී ස්වාමි පුරුෂයා හට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බව වෛද්‍යවරයාට ප්‍රකාශ කර නොමැති බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

තවද, පොලිසියේ රාජකාරියට බාධා කළ බවට චෝදනා කරමින් පැමිණිලිකාරිය සහ සිරියාවති (ස්වාමි පුරුෂයාගේ මව) ඇතුලු පිරිසකට විරුද්ධවද වගඋත්තරකාර පාර්ශවය විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව ද පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත.මෙම ගැටලුව හේතුවෙන් පැමිණිලිකාරිය ඇතුලු පිරිස සමාජයේ මහත් අපහසුතාවයකට පත් වූ බවත්, දෙපා කැඩීයාම නිසා සැමියාට මාස 03 කට අධික කාලයක් ජීවනෝපාය සිදු කිරීමට නොහැකි වී ඇති බවත්, ඒ තුළින් තමා ඇතුලු දරු දෙදෙනා මහත් අපහසුතාවයට පත් වී ඇති බවත් පැමිණිලිකාරිය වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි යන නිලධාරියාගේ කරුණු දැක්වීම.</u>

1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, 2024.07.27 වන දින පැය 17.30 ට පමණ අපරාධ අංශයට අනුයුක්ත උ.පො.ප. ඔබේසේකර නිලධාරියා විසින් රත්නපුර තානායම අසල දී සැකකාර ඒ.ජී. ජානක කිත්සිරි (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය අත්අඩංගුවට ගැනීමට යාමේදී ප්‍රශ්නයක් ඇති වූ බව තමා වෙත දැන්වූ බවත්, ඒ අනුව තමා එම ස්ථානයට නිලධාරීන් කිහිප දෙනෙකු සමඟ ගිය බවත්, එම අවස්ථාවේදී එකී ස්ථානයේ විශාල පිරිසක් ඒකරාශී වී සිටි බවත්, සැකකරුගේ නිවස අසල කාන්තාවන් කිහිපදෙනෙකු පොලිස් නිලධාරීන් වෙත බැන වදිමින් කෑ ගසමින් සිටි බවත්, රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ සේවය කරන නීතිඥ මහත්මයෙකුද එහි සිටි බවත් ය. ඉන්පසු තමා විසින් සැකකාර ඒ.ජී. ජානක කිත්සිරි (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය බල අපරාධයකට අදාළව අත්අඩංගුවට ගැනීමට පැමිණි බව පහදා දී සැකකරුගේ ඥාතීන් සමඟ කතා කර ප්‍රශ්නය නිරාකරණය කර සැකකරු පොලිස් ස්ථානයට රැගෙන යාමට කටයුතු කළ බවත්, ඒ අවස්ථාවේ දී ද රැස්ව සිටි අය කෑ ගසමින් බාධා කළ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

<u>2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඔබේසේකර නිලධාරියාගේ කරුණු දැක්වීම</u>

2 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඔබේසේකර නිලධාරියා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ 2024.07.23 දින ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, ස්ථානාධිපතිතුමාගෙන් ලද නියෝගයකට අනුව ස්ථානීය බල අපරාධ 214/24 ට අදාළව පුද්ගලයෙකුට පහරදී දත් හතරක් කඩා දැමීම සම්බන්ධයෙන් සැකකාර ඒ. ජී. ජානක කිත්සිරි යන අය සොයා ඔහුගේ නිවසට ගිය බවත්, සැකකරු නිවසේ නොසිටි බැවින් පැමිණිල්ලට අදාළව ඔහුගේ පුතා

වන ඒ.ජී. කාවින්ද ශිරාන් යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කරගත් බවත්, සැකකරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලෙසට සැකකරුගේ බිරිඳට දැනුම් දී පොලිස් ස්ථානයට පැමිණි බවත් ය. එහෙත් සැකකරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් නොකළ බැවින් එම සැකකරු නිවසේ සිටින බවට තමාට ලැබුණු තොරතුරු අනුව 2024.07.27 වන දින පැය 17.30ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 169 සහ ඡේදය 293 යටතේ සටහන් යොදා පො.කො. 54287 ළහිරු නිලධාරියා සමඟ සැකකරුගේ නිවස වෙත ගිය බවත්, එහි දී සැකකරු නිවසෙහි බිත්තියකින් පැන ඔහුගේ මහගෙදර දෙසට දිව ගිය බැවින් තමා හා පො.කො. 54287 ළහිරු නිලධාරියා ද ඔහු පසු පස දිව ගොස් නිවසට යාබදව පිහිටි සැකකරුගේ සහෝදරයාගේ නිවස පිටුපස දී අත්අඩංගුවට ගැනීමට උත්සහ කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. එහිදී සැකකරුගේ බිරිඳ හා තවත් කාන්තාවන් කිහිප දෙනෙකු ද පිරිමි පුද්ගලයන් කිහිප දෙනෙකු ද පැමිණ සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විරෝධය පෑ බවත්, එම පිරිස අතරේ සිටි පුද්ගලයින් බීමත්ව සිටි බවත්, එම අවස්ථාවේ දී රාජකාරී ඉටු කිරීමේ දී බාධා නොකරන ලෙසට තමා ඔවුන්ට දන්වා සිටි බවත් 2 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත. එසේම, එම අවස්ථාවේදී අමතර නිලධාරී කණ්ඩායමක් එම ස්ථානයට එවන ලෙස මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා වෙත දැනුම් දුන් බවත්, මද වේලාවකින් මූලස්ථාන පොලිස් පරික්ෂකතුමා ඇතුළු කණ්ඩායමක් එම ස්ථානයට පැමිණි බැවින් තත්ත්වය සමාදාන කර සැකකරු පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් 2 වගඋත්තරකරු සඳහන් කර ඇත.

2 වන වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, සැකකරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී කිසිදු පහරදීමක් හෝ කිසිදු කරදරයක් නොකර අවම බලය පමණක් භාවිත කර අත්අඩංගුවට ගැනීමට උත්සාහ ගැනීම පමණක් සිදු කළ බවත් ය. එසේම, තමා එම ස්ථානයේ රැස්ව සිටි පිරිසට රාජකාරියට බාධා නොකරන ලෙස දන්වා සිටි බවත්, ඒ බව ඉදිරිපත් කර ඇති වීඩියෝපටවල පැහැදිලිව දක්නට ලැබෙන බවත් 2 වන වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම, සැකකරු පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පසු දින ඔහුගේ පාද ඉදිමී තිබෙනු දුටු බැවින් තමා විසින් පැය 8.30ට පමණ රත්නපුර මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත සැකකරු ඉදිරිපත් කළ බවත්, අනතුරුව සැකකරු සම්බන්ධයෙන් අධිකරණය වෙත කරුණු වාර්තාකර බන්ධනාගාරගත කිරීමට පියවර ගත් බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2 වන වගඋත්තරකරුගෙන් "සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේ දී නිලධාරීන් සිවිල් ඇඳුමෙන් සැරසී යාමට විශේෂ හේතුවක් තිබුණාද?' යනුවෙන් නැගූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් 2 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, එම අවස්ථාවට පෙර 2 වන හා 3 වන වගඋත්තරකරුවන් වැටලීමක් සිදු කර සැකකරුවකු හා දේපල අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරමින් සිටි අතර, එම අවස්ථාවේ තමා හා 3 වන වගඋත්තරකරු සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත්, නිල ඇඳුම් ඇඳ සිටි නිලධාරීන් වෙනත් වැටලීමක්

සඳහා පිටත්ව ගිය අතර, තමා හා 3 වන වගඋත්තරකරු එම ස්ථානයේ රැඳී සිටි බවත්ය. එම අවස්ථාවේ සැකකරු සම්බන්ධව හදිසියේ තොරතුරු ලැබුණු බැවින් ඔහු එම ස්ථානයෙන් වෙනත් ස්ථානයකට බැහැරව යාමට හැකි බැවින් හා ඉක්මනින් සැකකරු වෙත යායුතු බැවින් ඇඳ සිටි සිවිල් ඇඳුමින්ම එම ස්ථානය වෙත පිටත් වූ බවත් 2 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

**3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු නිලධාරියාගේ කරුණු දැක්වීම.**

3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු නිලධාරියා 2024.10.23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, අපරාධ අංශ ස්ථානාධිපතිගෙන් ලද තොරතුරකට අනුව ඒ. ජී. ජානක කිත්සිරි යන අයට එරෙහිව ලැබී ඇති පැමිණිල්ල මත අත්අඩංගුවට ගැනීම සඳහා උ.පො.ප. ඔබේසේකර යන අය සමඟ 2024.07.27 වන දින පැය 17.30 ට පුද්ගලික යතුරුපැදියකින් සැකකරුගේ නිවස වෙත පිටත්ව ගිය බවයි. සැකකරුගේ නිවසට ගොස් සැකකරු පිළිබඳ ඔහුගේ බිරිඳගෙන් විමසූ බවත්, ඇය විසින් ඔහු නිවසේ නොමැති බව පැවසූ විට තමා විසින් සැකකරුගේ ත්‍රීරෝද රථය තියෙනවා යැයි බිරිඳට පැවසූ බවත් 3 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. එවිටම නිවස තුළින් යම් ශබ්දයක් ඇසුනු බවත්, තමා නිවස තුළට ඇතුළු වූ බවත්, සැකකරු නිවසේ සිට එම නිවස වෙන්කොට තිබූ බිත්තියෙන් එහා පැත්තට පැන අසල තිබූ වඳුලක් දෙසට දිව ගිය බවත්, තමා ද ඒ පසු පස දිව ගිය බවත්, එසේ දිවයාමේ දී සැකකරු බිම වැටුනු බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර නිලධාරියා හා තමා සැකකරු පසුපස දිව ගිය බවත්, අත්අඩංගුවට ගැනීමේ දී කිසිඳු පහර දීමක් සිදු නොකළ බවත්, සැකකරු ඇවිදීමට නොහැකිව වැටී සිටිය දී අත්අඩංගුවට ගැනීම පමණක් සිදු කළ බවත් 3 වන වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එසේම, සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේ දී එම ස්ථානයට පැමිණි නිවැසියන් තමාට හා 2 වන වගඋත්තරකරුට බැන තර්ජනය කළ බවත්, ඒ අවස්ථාවේදී මූලස්ථාන පොලිස් පරීක්ෂකට දුරකතනයෙන් දැනුම් දුන් බවත්, මූලස්ථාන පොලිස් පරීක්ෂක ඇතුළු තවත් කණ්ඩායමක් පැමිණ සැකකරු අත්අඩංගුවට ගත් බවත් 3 වන වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. මෙසේ තම රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් අලුත්ගමගේ ප්‍රියන්ත ඉරෝෂ යන අය අත්අඩංගුවට ගත් බවත්, අලුත්ගමගේ එරංග හර්ෂන, රණතුංග ආරච්චිලාගේ සිරියාවතී, මොහොමඩ් මුන්ෂිෆ්, මොහොමඩ් මදනි හා කුංචනා ඉෂානි ලොකු කැටගොඩ යන අය 2024.07.31 වන දින රත්නපුර මහා අධිකරණයට භාර වූ බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, 2024.07.28 දින පෙ.ව 9.35ට සැකකාර ඒ.ජී. ජානක කිත්සිරි යන අය රෝහල් ගත කළ බවත්, අනතුරුව වැඩබලන මහේස්ත්‍රාත්වරිය රෝහල වෙත පැමිණ සැකකරු රිමාන්ඩ් භාරයට පත් කළ බවත්, 2024.08.31 වන දින සැකකරුට ඇප ලබා දුන් බවත්, පැමිණිලිකරුට පහරදීම සම්බන්ධයෙන් කරන සියලු චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**4 වන වගඋත්තරකාර පො.සැ.35072 රුවන් නිලධාරියාගේ කරුණු දැක්වීම.**

මෙම පැමිණිල්ලට අදාළව 2024.07.27 දින රත්නපුර පොලිස් ස්ථානයේ උප සේවය භාරව සිටි 3 වන වගඋත්තරකාර පො.සැ. 5072 රුවන් නිලධාරියා විසින් 2025.10.24 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, තමාට දිනය නිවැරදිව මතක නොමැති බවත්, අදාළ සිදුවීම මතකයේ ඇති බවත්, තමා උප සේවක වශයෙන් රාජකාරී කටයුතු කරමින් සිටියදී උ.පො. ප. ඔබේසේකර මහතා සැකකරුවකු තමාට භාර දුන් බවත්, අදාළ සැකකරු පරික්ෂා කර භාරගත් බවත්, කිසිදු සිරීම් තුවාලයක් නොතිබූ බවත්, අසනීප තිබේ දැයි සැකකරුගෙන් විමසූ බවත්, එහි දී සැකකරු "දැනට එහෙම කිසි ප්‍රශ්නයක් නැතැයි" පැවසූ බවත් ය. එසේම, සැකකරු අත්අඩංගුවට ගැනීමේ දී පලායාමට ගොස් ඇද වැටුනු බව උ.පො.ප ඔබේසේකර මහතා තමාට පැවසූ බවත්, කිසිදු තුවාලයක් නොමැති නිසා සැකකරු සිර මැදිරියේ රඳවා තැබීමට තමා කටයුතු කළ බවත් 4 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු**

වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය 2024.07.27 වන දින වගඋත්තරකාර නිලධාරීන් පැමිණ අත්අඩංගුවට ගැනීමට යාමේ දී නිවසේ ඇතුළත අඩි 08ක් පමණ උස බිත්තියෙන් පැන දිවූ බවත්, යාබද නිවස පිටුපස කැළෑ රොදක් වැටී සිටියදී අත්අඩංගුවට ගත් බවත්, පොලිස් නිලධාරීන් විසින් වින්දිත පාර්ශවයට පහරදීමෙන් දෙපා කැඩුනු බවට තමාට සැකයක් පවතින බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම තම 15 හැවිරිදි පුතා සහ 8 හැවිරිදි දියණිය දුටු බවද පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ලට අදාළව විමර්ශනයක් සිදු කර ඇති අතර, පහත නම් සඳහන් වින්දිත පාර්ශවය හා ඔහුගේ 15 හැවිරිදි පුතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවා ප්‍රකාශ සටහන් කර ඇත.

1. ඒ. ජී. ජානක කිත්සිරි (වින්දිත තැනැත්තා)
2. ඒ.ජී. කාවින්ද ශිරාන් (වින්දිත තැනැත්තාගේ පුතා)

වින්දිත පාර්ශවය වන ඒ. ජී. ජානක කිත්සිරි යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2024.07.28 වන දින සවස තමා සාලයේ හාන්සි වී සිටියදී, යම් කිසිවෙකු කෑ ගසමින් එනු ඇසී විශේෂ කාර්ය බලකායෙන් තමාට පහරදීමට පැමිණෙනු ඇතැයි සිතා තම නිවසේ බිත්තියෙන් පැන අනෙක් පස ඇති මහගෙදරට ගොස් ගෙට පල්ලෙහා ඇති මල්ලිලාගේ නිවස දෙසට දිව ගිය බවයි. එසේම, මල්ලිලාගේ නිවස අයිනට වන්නට අඩි තුනක විතර පල්ලමක් සහ කැළයක් ඇති බවත්, එම ස්ථානයේදී පිටුපසින් පැමිණි අය තමාව තල්ලු කළ අතර, එහිදී තමා එම කැළෑව තුළට ඇද වැටුනු බවත්, එවිට එක් අයකු පැමිණ තම කකුල් පාගන ලද බවත්, එවිට තම කකුල කැඩී ගිය බවත්, ඉන්

අනතුරුව තමාගේ කෑ ගැසීම් ශබ්දය ඇසී තම ඥාතීන් පැමිණි බවත්, එහිදී තමා නැගී සිටීමට උත්සහ කළ ද තමාව ඇද වැටුනු බවත් වින්දිත පාර්ශවය වන ඒ. ජී. ජානක කිත්සිරි යන අය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

පොලිස් නිලධාරින් අතරින් උප පොලිස් පරීක්ෂකවරයා අතැතිව කැන්ද ගසක පොල්ලක් වැනි අඩි 3 ක් පමණ දිගැති ඒ වෙලාවේ කඩාගන්නා ලද පොල්ලක් තිබූ බවත්, ඔහු විසින් එම පොල්ල අතැතිව තමාගේ ගෙල අල්ලාගෙන සිටි නමුත්, එම පොල්ලෙන් පහරදීම් නොකළ බවත් වින්දිත පාර්ශවය වන ඒ. ජී. ජානක කිත්සිරි යන අය සඳහන් කර ඇත.

එසේම, පැමිණිලිකාරියගේ සහ වින්දිත තැනැත්තාගේ පුතා වන ඒ.ජී.කාවින්ද ශිරාන් යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, අදාළ සිදුවීම වූ දිනය තමාට හරිහැටි මතක නොමැති බවත්, එකී සිදුවීම සිදු වූ දිනයේ සවස 4.30න් පසුව තමා නිවසේ නිදා සිටියදී කිසිවෙකු කෑ ගසනු ඇසුණු බවත්, එලෙස ශබ්දය ඇසුණු දිශාවට ගොස් බැලීමේදී කැලෑව තුළ තම පියාට කොළ පැහැති ටීෂර්ට් එකක් හැඳ සිටි අයකු පහරදෙනු දුටු බවත්, තමා සිටි ස්ථානයේ සිට එම ස්ථානයට මීටර් 50 ක් 100 ක් පමණ දුරක් පැවති බවත් ය. එහිදී කොළ පැහැති ටීෂර්ට් එක හැඳ සිටි පුද්ගලයා තම පියාගේ ඇඟ මත නැග පියාගේ කකුල පාගනු තමා දුටු බවත්, එම ස්ථානයේ තමා, තම නැගණිය සහ මව සිටි බවත්, කොළ පැහැති ටීෂර්ට් එක හැඳ සිටි පුද්ගලයා අතෙහි දර පොල්ලක් වැනි පොල්ලක් තිබූ බවත්, එමඟින් තම පියාගේ කකුල් දෙකෙහි පහළ කොටසට පහරදෙනු තමා දුටු බවත් ඒ.ජී.කාවින්ද ශිරාන් යන අය වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ</u>

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය 2024.07.16 වන දින පුද්ගලයෙකු සමඟ ආරවුලක් ඇති කරගනිමින් එම පුද්ගලයාට පහර දී ඇති බවත්, ඒ හේතුවෙන් එම තැනැත්තා විසින් රත්නපුර පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එම පැමිණිල්ල රත්නපුර පොලිස් ස්ථානයේ බල අපාරධ 214/24 යටතේ සටහන්ව ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව එම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය 2024.07.27 වන දින පැය 17.50ට 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර සහ 3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවත් 2024.07.27 වන දින පැය 19.15ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපාරධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 සහ ඡේදය 294 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. මෙලෙස අත්අඩංගුවට ගැනීම සඳහා 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත තැනැත්තාගේ නිවස වෙත ගිය අවස්ථාවේ දී වින්දිත තැනැත්තා නිවසේ බිත්තියකින් පැන ඒ අසල පිහිටි ඔහුගේ මහගෙදර දෙසට දිව ගොස් ඇති බවත්, පසුව ඒ අසල පිහිටි ඔහුගේ

සහෝදරයෙකුගේ නිවස දෙසට දිව ගොස් ඇති බවත්, ඉන් අනතුරුව ඒ ආසන්නයේ තිබෙන කැළෑ රොදක වැටී සිටියදී වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගෙන ඇති බවත් පැමිණිලිකාරිය, වින්දිත පර්ශවය සහ වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අනුව පෙනී යයි.
පැමිණිලිකාරිය විසින් වින්දිත පාර්ශවයට පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීමේදී පහරදීමක් සිදු කර ඇති බවට ප්‍රකාශ කර ඇති බැවින් ඒ පිළිබඳව සිදු කළ විමසීමේදී පැමිණිලිකාරිය නිශ්චිතව කරුණු ඉදිරිපත් නොකරන අතර, ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ද යම් යම් පරස්පරතාවයන්ගෙන් යුක්ත බවට නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 196/24 සහ 2024.07.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ වින්දිතගේ ශරීරයේ බරපතල නොවන තුවාල 17 ක් හා බරපතළ තුවාල 02 ක් පවතින බවට සඳහන් ඇති අතර, ඒවා පහත පරිදි විස්තර කර ඇත.

1. An abrasion, brown, 0.5cm × 0.5cm placed over the right side of the forehead above the eye.
2. An abrasion, brown, 0.5cm × 1cm placed middle of the chest.
3. A grazed abrasion, brown, 5cm × 8cm placed inner aspect of left arm.
4. A grazed abrasion, brown, 4cm × 8cm placed inner aspect of left forearm.
5. An abrasion, 0.5cm × 2cm placed middle of the right foreleg.
6. A linear abrasion, 5cm placed obliquely over the left shoulder back.
7. A linear abrasion, 8cm placed obliquely over the right shoulder back.
8. An abrasion, 1cm × 2cm placed middle of back of the chest.
9. An abrasion, 4cm placed obliquely left upper lumber region.
10. An abrasion, brown, grazed in 2cm× 4cm placed over the right loin.
11. An abrasion, 0.5cm× 1cm over the left lumbar region 5cm below the injury No. (9).
12. An abrasion, brown, 0.5cm× 1cm placed middle of lumbar region.
13. An abrasion, brown, 0.5cm× 1cm placed 3cm below the injury no. (12)
14. An abrasion, brown, 0.5cm× 1cm placed 4cm below the injury no. (13)
15. An abrasion, brown, 0.5cm × 4cm placed over the left buttock.
16. An abrasion, brown, 0.5cm × 1cm placed back of the left mid-thigh.
17. An abrasion, brown, 0.5cm × 2cm placed back of the right upper thigh.
18. A contusion, irregular, approximately 4cm×5cm size bluish black noted over the left ankle inner side. It was associated with an underlying calcaneal bone fracture.
19. A contusion, irregular, approximately 3cm×5cm placed over the right ankle. It was associated with an underlying right calcaneal bone fracture.

මෙහි දී අධිකරණ වෛද්‍යවරයා වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, ඉහත අංක1 සිට 17 දක්වා වන තුවාල, මොට ආයුධවලින් සිදුව ඇති බරපතල නොවන තුවාල වන බවයි. වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශයක් ලබා දෙමින්, පොලිස් නිලධාරීන් විසින් තමාගේ කකුල් පාගා කඩා දැමීම හැර වෙනයම් පහරදීමක් සිදු නොකළ බවට සඳහන් කර ඇත. එසේම, තමා නිවස තුළ ඇති අඩි 8 ක් පමණ උසැති බිත්තියෙන් පැන යාබද කැළෑ රොදක් වෙත දිව ගිය බවත් වින්දිත පාර්ශවය විසින් පිළිගෙන ඇත. තමා ඒ අවස්ථාවේදී සරමක් පමණක් හැඳ සිටි බවද වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති බැවින් ඉහත සඳහන් අංක 1 සිට 17 දක්වා වන තුවාල, වින්දිත පාර්ශවය උඩුකය නිරුවත්ව නිවසේ බිත්තියෙන් පැන කැලෑ රොදක් වෙත දිව යාමේ දී සිදු වූ තැලීම් හා සීරීම් තුවාල වීමේ හැකියාව ඇත.

තවද, ඉහත කී අධිකරණ වෛද්‍ය වාර්තාවේ අංක 18 සහ 19 තුවාල අධිකරණ වෛද්‍යවරයා විසින් පහත පරිදි සටහන් කර ඇත.

18. A contusion, irregular, approximately 4cm×5cm size bluish black noted over the left ankle inner side. It was associated with an underlying calcaneal bone fracture.
19. A contusion, irregular, approximately 3cm×5cm placed over the right ankle. It was associated with an underlying right calcaneal bone fracture.

ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල අංක 18 යටතේ දක්වා ඇත්තේ, “වම් වළලුකර අභ්‍යන්තරයට ඉහළින් 4cm × 5cm පමණ ප්‍රමාණයේ නිල් පැහැති කලු පැහැයක් ඇති අක්‍රමවත් තැලීමක් ඇති බවත්, එය යටින් පවතින කැරකෝනියල් අස්ථි බිඳීම සමඟ සම්බන්ධ වී ඇති බවත් ය. එසේම, තුවාල අංක 19 යටතේ දක්වා ඇත්තේ, “දකුණු වළලුකර අභ්‍යන්තරයට ඉහළින් 3cm × 5cm පමණ ප්‍රමාණයේ අක්‍රමවත් තැලීමක් ඇති බවත්, එය යටින් පවතින දකුණු කැරකෝනියල් අස්ථි බිඳීම සමඟ සම්බන්ධ වී ඇති බවත් ය.

එසේම, වින්දිත තැනැත්තා ලබා දුන් රෝග ඉතිහාසය අධිකරණ වෛද්‍යවරයා විසින් පහත පරිදි සඳහන් කර ඇත.
“මේක වුනේ 2024.07.27 සවස 5.50 ට විතර තානායම පාරෙදි. මම ගෙදර නිදාගෙන සිටියා. ගෙදරට ආවා සිවිල් ඇඳුමෙන් කට්ටිය. අපි පොලීසියේ කියලා කිව්වා. මම බයට පල්ලෙහාට දිව්වා. දුවනකොට මාව වැටුනා. කැලෑ හරියක් ඒ ටික. ඒ ටිකේ ගල්, බොරළු තියනවා, අගලක් තියනවා. එතනදි කකුල පෙරලිලා මාව වැටුනා. අඩි 15 ක් විතර පහලට වැටුනා. මහත්තුරු එතකොට මාව අල්ලගත්තා. මට ගැහුවේ නෑ. දුවනකොට වැටෙනකොට මුහුණ තුවාල වුනා විතරයි. ගහපුවා නෑ. මම සරම විතරයි ඇඳලා හිටියේ. ඊට පස්සේ මාව රත්නපුර පොලීසියට ගෙනාවා. කූඩුවට දැම්මා. ගැහුවේ නෑ. කෑම ලැබුනා. අද උසාවි අරන් ආවා. දැනට කකුල් දෙක රිදෙනවා. ඇඟ සීරිලා. වැටෙනකොට වුන ඒවා” යනුවෙනි.

එසේම, රෝගියා විසින් ලබා දී ඇති ඉහත සඳහන් කෙටි රෝග ඉතිහාසය සමඟ ඉහත කී බරපතල තුවාල දෙකද ඇතුළුව පවතින තුවාල සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරයා සිය මතය සටහන් කොට ඇත. ඒ අනුව එම තුවාල වින්දිත තැනැත්තා ලබා දී ඇති රෝග ඉතිහාසයෙහි සඳහන් පරිදි ඔහු දිවීමෙන් සහ බිම වැටීමෙන් ඇති වූ ඒවා බව අධිකරණ වෛද්‍යවරයා විසින් තහවුරු කර ඇත. මේ අනුව පහරදීමක් සනාථ කිරීම සඳහා පවතින ප්‍රබලම සාක්ෂියක් වන අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි අධිකරණ වෛද්‍යවරයා විසින් ඇතුළත් කර ඇති කරුණු සහ පොලිස් නිලධාරීන් විසින් තමා හට පහරදීමක් සිදු නොකළ බවට වින්දිත තැනැත්තා විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති රෝග ඉතිහාසය අනුව පොලිස් නිලධාරීන් විසින් මෙම වින්දිත පාර්ශවය වන ඒ. ජී. ජානක කිත්සිරි යන අයට පහරදීමක් සිදුකළ බව තහවුරු නොවේ.

වින්දිත පාර්ශවය කියා සිටින්නේ, පොලිස් නිලධාරීන් විසින් තමාට තර්ජනය කිරීම හේතුවෙන් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉහත ප්‍රකාශය ලබා දුන් බවයි. කෙසේ වෙතත්, පැමිණිලිකාරියගේ, වින්දිත පාර්ශවය වන ඒ. ජී. ජානක කිත්සිරි යන අයගේ සහ වගඋත්තරකරුවන්ගේද ප්‍රකාශ වලට අනුව මෙම ඒ. ජී. ජානක කිත්සිරි යන අය අඩි 8 ක් පමණ උසැති බිත්තියකින් ක්ෂණිකව ගත් තීරණයකට අනුව පැන, කැළෑබද ප්‍රදේශය වෙත දිව ගිය බවට ප්‍රකාශ කර ඇත. 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ වලට අනුව බිම වැටී ඇවිදීමට නොහැකිව සිටි සැකකරු අත්අඩංගුවට ගැනීම පමණක් කළ බවට සඳහන් කර ඇත.  තවද, දෙපාර්ශවය විසින්ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වීඩියෝ දර්ශන අනුව මෙම ඒ.ජී. ජානක කිත්සිරි යන අය බිම ඇද වැටී සිටිනු නිරීක්ෂණය කළ හැකි වුවද පහරදීමේ අවස්ථාව වීඩියෝ ගත වී නොමැත.

තවද, පහරදීමට අදාළව ඇසින් දුටු සාක්ෂියක් ලෙස පැමිණිලිකාරියගේ  සහ වින්දිත තැනැත්තාගේ දරුවා වන ඒ.ජී. කාවින්ද ශිරාන් යන අය විසින් කොමිෂන් සභාව හමුවේ ලබා දී ඇති ප්‍රකාශය සහ වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අයගේ ප්‍රකාශයන්වල ද පරස්පර කරුණු ඇතුළත්ව ඇති බව නිරීක්ෂණය වේ. එනම්, වින්දිත පාර්ශවය විසින් වගඋත්තරකාර පාර්ශවය පොල්ලක් අතැතිව සිටිය ද ඉන් තමාට පහර නොදුන් බව පවසා සිටියදී, ඉහත කී සාක්ෂිකාර පැමිණිලිකාරියගේ සහ වින්දිත තැනැත්තාගේ දරුවා වන ඒ.ජී. කාවින්ද ශිරාන් යන අය විසින් තම පියා (වින්දිත පාර්ශවය)ට වගඋත්තරකාර නිලධාරීන් විසින් පොල්ලකින් පහරදෙනු දුටු බවට ප්‍රකාශ කර ඇත. එසේ හෙයින් එකිනෙකට වෙනස් වූ කරුණු තිබීම මත පැමිණිලිකාරියගේ  සහ වින්දිත තැනැත්තාගේ දරුවා වන ඒ.ජී. කාවින්ද ශිරාන් යන අයගේ ප්‍රකාශය මෙම පහරදීම තහවුරු කිරීම සඳහා ප්‍රබල සාක්ෂියක් ලෙස යොදා ගැනීම අසීරු බව පෙනී යයි.

මේ අනුව, අධිකරණ වෛද්‍ය වාර්තාවේ 18 සහ 19 යටතේ දක්වා ඇති අස්ථි බිඳීයාම වගඋත්තරකරුවන්ගේ පහරදීමක්/පෑගීමක් හේතුවෙන් සිදුවූවක්ද එසේ නොමැති නම් පැමිණිලිකරු අඩි 08ක් පමණ උස බිත්තියෙන් පැන දුවන අවස්ථාවේ දී සිදු වූවක්ද යන්න නිශ්චිත නිගමනයකට එළඹීමේ හැකියාවක් නොමැත.

තවද, වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම 2024.07.27 වන දින පැය 17.50ට සිදු කර ඇති අතර, ඔහු ඇවිදීමට අපහසුවෙන් රිය පහන්වන තුරු පොලිස් ස්ථානයේ රැඳී සිට ඇත. වින්දිතයා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී තමාව රෝහල වෙත රැගෙන යන ලෙසට පොලිස් නිලධාරීන්ට පවසා ඇති අතර එදින උපසේවය භාරව කටයුතු කළ 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් 2024.07.27 වන දින පැය 20.00 ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 ඡේදය 294 යටතේ සටහන් කර ඇත්තේ "වම් හා දකුණු කකුල්වල ඇස් වටයට පහළ ඉදිමුම් සහිතයි. ඇවිදීමට අපහසු තත්ත්වයක් ඇත. වෙනත් අසනීප තත්ත්වයක් නොමැත. මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග ලැබෙන තෙක් සිර මැදිරියේ රඳවා තබමි" යනුවෙනි.

එසේම, 2025.10.24 වන දින කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි 4 වන වගඋත්තරකාර පො.සැ.35072 රුවන් නිලධාරියා විසින් කොමිෂන් සභාව විමසූ ප්‍රශ්න සඳහා පහත පරිදි පිළිතුරු ලබා දී ඇත.

ප්‍රශ්නය : අදාළ පුද්ගලයා කිසියම් අසනීපයකට බෙහෙත් ඉල්ලා සිටියාද?

පිළිතුර : නැහැ

ප්‍රශ්නය : ඔබතුමා කියන පරිදි සැකකරුගේ ශරීරයේ කිසිදු තුවාලයක් තිබුණේ නැහැ?

පිළිතුර : නැහැ

ප්‍රශ්නය : සැකකරු සාමාන්‍ය විදියට ඇවිදගෙන ආවද?

පිළිතුර : ඔව්. සාමාන්‍ය විදියට ඇවිදගෙන ආවා.

ප්‍රශ්නය : රාත්‍රී කාලයේදී අදාළ සැකකරු කෑගසනවා ඇහුණද?

පිළිතුර : කොහොමත් සිරමැදිරියේ සැකකරුවන් සිටින විට කෑ ගහනවා. ඒ නිසා නිශ්චිතව මෙම සැකකරු කෑ ගැසුවේදැයි මතකයක් නැහැ.

ප්‍රශ්නය : ඔබතුමා අදාළ සැකකරු හොඳින් නිරීක්ෂණය කළා යැයි පැවසුවා. එසේ නිරීක්ෂණය කළේ නම් ඔහුගේ දෙපාවල අස්ථි කණ්ඩනයක් වී ඇති බවක් නිරීක්ෂණය නොවූයේ ඇයි?

පිළිතුර : ඒ අවස්ථාවේදී පිටින් සීරීමක්වත් තිබුණේ නැහැ.

ප්‍රශ්නය : ඔහු සාමාන්‍ය පරිදි කාලය ගෙවුවද?

පිළිතුර : උපසේවක ඉන්න තැනට සිර මැදිරිය නිරීක්ෂණය වෙන්නේ නැහැ. අපි පැයකට වරක් පමණ සිරමැදිරියට ගොස් පරීක්ෂා කර බලා සටහන් යොදන එක තමයි කරන්නේ.

ඉහත සඳහන් 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් 2024.07.27 වන දින පැය 20.00ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 ඡේදය 294 යටතේ යොදා ඇති සටහනෙහි ඇතුළත් කරුණු සහ 2025.10.24 වන දින කොමිෂන් සභාව හමුවේ පෙනී සිට ලබා දී ඇති ඉහත සඳහන් පිළිතුරුවල ඇතුළත් කරුණු එකිනෙක පරස්පර වන බව නිරීක්ෂණය වේ. ඒ අනුව 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් 2024.07.27 වන දින පැය 20.00 ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 ඡේදය 294 යටතේ යොදා ඇති සටහනෙහි "වම් හා දකුණු කකුල්වල ඇස් වටයට පහළ ඉදිමුම් සහිතයි. ඇවිදීමට අපහසු තත්ත්වයක් ඇත" යනුවෙන් සටහන් යොදා තිබුණ ද, 2025.10.24 වන දින කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ, වින්දිත තැනැත්තාගේ ශරීරයේ කිසිදු තුවාලයක් නොතිබුණු බවත්, ඔහු සාමාන්‍ය පරිදි ඇවිදගෙන පැමිණි බවත් ය. කෙසේවෙතත් පොලිස් අත්අඩංගුවට පත්වන අයෙකු අදාළ අත්අඩංගුවට ගැනීම සිදු කළ නිලධාරීන් විසින් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ පසු එම තැනැත්තා පරීක්ෂා කර බලා භාරගැනීමේ වගකීම එදිනට උප සේවය භාරව සිටින නිලධාරියා සතුව පවතියි. ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළ 2024.07.27 වන දින උප සේවය භාරව සිටි නිලධාරියා වශයෙන් 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් වින්දිත තැනැත්තාගේ ශරීරයේ පැවති අපහසුතා පරීක්ෂා කර බලා සටහන් කර ඇත. එහෙත් කොමිෂන් සභාව වෙත ඊට හාත්පසින්ම වෙනස් වූ කරුණු ඉදිරිපත් කර ඇත. එසේම, වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 196/24 සහ 2024.07.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඔහුගේ ශරීරයේ නළල, පපු ප්‍රදේශය, අත්, උරහිස් ආදී ස්ථානවල සීරීම් තුවාල 17ක් ඇති බවට අධිකරණ වෛද්‍යවරයා සඳහන් කර ඇති අතර, ඒ කිසිදු තුවාලයක් 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් වින්දිත තැනැත්තා පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය නොවීම ගැටලු සහගත බව ද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර දක්වා ඇත්තේ "මම කිව්වා මාව ඉස්පිරිතාලෙට ගිහින් දාන්න කියලා. මම කෑ ගැහුවා. වටේ ඉන්න අපේ අයත් කෑ ගැහුවා. මාව ඉස්පිරිතාලෙ ගිහින් දාන්නම් කියලා HQI මහත්තයත් කිව්වා. ඒ වුනාට ගිහින් දැම්මේ නෑ. පොලීසියට තමයි එක්කන් ගියේ. හිර කූඩුව ගාව පුටුවක් තිබුණා. එතන ගැහැනු කෙනෙකුත් හිටියා සොරකම් කරලා ආපු. මට කිව්වා ඇවිදලා යන්න කියලා. මට යන්න බැහැ. රෑ එළිවෙනකල්ම හිටියා. පෙනඩෝල් පෙත්තක්වත් දෙන්න කවුරුත් හිටියෙ නෑ" යනුවෙනි.

එසේම, තමාව පොලිස් ස්ථානය වෙත ගෙන යාමෙන් පසු තමාට ඇවිදීමට නොහැකි වූ බවට පැවසූ බැවින් රථයේ සිටි අනෙක් නිලධාරියා තමාව ඔසවාගෙන ගොස් පුටුවක හිඳුවන ලද බවත්, එම අවස්ථාවේදී තම බිරිඳ පැමිණ තමාට වතුර ලබා දුන් බවත්, එම අවස්ථාවේදීද තමාට ඇවිදගෙන යන ලෙසට තර්ජනාත්මකව පවසන ලද බවත්, පසුව එම ස්ථානයේ සිටි අයකු තමාව ඔසවාගෙන ගිය බවත්, තමාව උදෑසන වනතෙක්ම පුටුවෙහි හිඳුවා තබන ලද අතර, කෑමට කිසිවක් ලබා නොදුන් බවත්, ඒ වන විට තමාගේ කකුල ඉදිමී තිබූ බවත් වින්දිත පාර්ශවය පැමිණිල්ලේ... 

<u>නිගමනය</u>

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව සලකා බැලීමේ දී වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය 2024.07.16 වන දින පුද්ගලයෙකු සමඟ ආරවුලක් ඇති කරගනිමින් එම පුද්ගලයාට පහර දී ඇති බවත්, ඒ හේතුවෙන් එම තැනැත්තා විසින් රත්නපුර පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එම පැමිණිල්ල රත්නපුර පොලිස් ස්ථානයේ බල අපාරධ 214/2024 යටතේ සටහන්ව ඇති බවත් නිරීක්ෂණය වේ. 2024.07.16 වන දින එවැනි ආකාරයේ ආරවුලක් සිදු වූ බවට පැමිණිලිකාර පාර්ශවය සහ වින්දිත පාර්ශවය විසින් ද පිළිගෙන ඇත. ඒ අනුව ඉහත කී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වගන්තිය ප්‍රකාරව සලකා බැලීමේ දී වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අයට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී ඇති බව නිරීක්ෂණය වේ. එසේහෙයින් එම පැමිණිල්ලට අදාළව වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගැනීම නීතියට අනුකූලව සිදු කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 196/24 සහ 2024.07.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ වින්දිත තැනැත්තාගේ ශරීරයේ බරපතල නොවන තුවාල 17 ක් හා බරපතළ තුවාල 02 ක් පවතින බව සඳහන්ව තිබුණ ද, එකී තුවාල වගඋත්තරකාර පාර්ශවය විසින් සිදු කරන ලද පහරදීම් හේතුවෙන් සිදු වූ ඒවා බවට ඉහතින් සඳහන් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු හෝ ඇසින් දුටු බවට සඳහන් අයගේ ප්‍රකාශයන් මගින් තහවුරු නොවන බැවින්, පැමිණිල්ල මගින් දක්වා ඇති පරිදි 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර සහ 3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු යන නිලධාරීන් විසින් වින්දිත පාර්ශවය වෙත පහරදීමක් සිදු කර ඇති බව තහවුරු නොවන බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

ඉහතින් සඳහන් කර ඇති පරිදි වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය 2024.07.27 වන දින පැය 17.50ට 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර සහ 3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. එදින උප සේවය භාරව සිටි 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් 2024.07.27 වන දින පැය 20.00 ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 ඡේදය 294 යටතේ යොදා

ඇති සටහන අනුව වින්දිත තැනැත්තා පරීක්ෂා කර බලා “වම් හා දකුණු කකුල්වල ඇස් වටේට පහළ ඉදිමුම් සහිතයි. ඇවිදීමට අපහසු තත්ත්වයක් ඇත. වෙනත් අසනීප තත්ත්වයක් නොමැත. මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග ලැබෙන තෙක් සිර මැදිරියේ රඳවා තබමි.” යනුවෙන් සටහන් කර ඇත. කෙසේවෙතත් එලෙස පාදවල ඉදිමුම් තත්ත්වයක් සහ ඇවිදීමට අපහසු තත්ත්වයක් පවතින බව සටහන් කර තිබුණ ද, වින්දිත තැනැත්තා රත්නපුර මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් ඇත්තේ අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2024.07.28 වන දින පැය 08.30ට බව 2024.07.28 වන දින පැය 08.30ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 180 ඡේදය 301යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි.

ඉහතින් දක්වා ඇති පරිදි වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 196/24 සහ 2024.07.28 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ බරපතල නොවන තුවාල 17ක් සහ අස්ථි බිඳීයාම් 02ක් පවතින බවට දක්වා ඇති අතර, එකී අස්ථි බිඳීයාම් 02 බරපතල තුවාල දෙකක් බවද දක්වා ඇත. ඒ අනුව වින්දිත පාර්ශවය හට අත්අඩංගුවටපත් වේලාවේ සිට පසුදින වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන තෙක් පැය ගණනාවක් බරපතල තුවාල දෙකක් ද සමඟ තුවාල 19ක් ශරීරයේ තිබිය දී වේදනාත්මකව සිටීමට සිදු ව ඇති බව නිරීක්ෂණය වේ.

පොලිසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීති රීති පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක ‘ඒ 20’ හි දක්වා ඇත. අංක ‘ඒ 20’හි 4 (ඒ) වගන්තිය අනුව, සිරභාරයට ගත් සෑම කෙනෙකුම එසේ සිරභාරයට ගත් වහාම සෝදිසි කළ යුතු බවත්, පොලිස් ස්ථානයකට පැමිණි පසු එම තැනැත්තා නැවත සෝදිසි කළ යුතු බවත්, ඒ අනුව සටහන් පොතේ ද තොරතුරු පොතේ ද යෝග්‍ය සටහන් ලිවිය යුතු බවත්, සිර කාමරයේ දැමීමට පළමු, තුවාල ආදීයක් වේ නම් ඒ ගැන සටහනක් තොරතුරු පොතේ ලිවිය යුතු බවත්, **සිරභාරයේ සිටින තැනැත්තා වෛද්‍ය නිලධාරියෙකු හමුවීමට කැමැත්තේ ද නැතහොත් තම ශරීරයේ ඇති යම් තුවාලයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට කැමැත්තේ ද යන වග ඔවුන්ගෙන් විමසිය යුතු බවත්, ඉදින් ඔහු වෛද්‍ය නිලධාරියෙකු හමුවීමට හෝ ප්‍රකාශයක් කිරීමට හෝ කැමැත්තේ නම්, කාරණයට ගැළපෙන පරිදී වෛද්‍ය නිලධාරියෙකු ලබා ගැනීමට හෝ ඔහුගේ ප්‍රකාශ සටහන් කිරීමට හෝ වහාම කටයුතු පිළියෙල කළ යුතු බවත්** සඳහන් කර ඇත.

ඒ අනුව වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව එදින උප සේවය භාරව සිටි 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් ඔහුව පරීක්ෂා කර ඇති බවත්, වින්දිත තැනැත්තාගේ වම් හා දකුණු කකුල්වල ඇස් වටේට පහළ ඉදිමුම් සහිත බවටත්, ඇවිදීමට අපහසු තත්ත්වයක් ඇති බවටත්, වෙනත් අසනීප තත්ත්වයක් නොමැති බවටත් 2024.07.27 වන දින පැය 20.00 ට රත්නපුර පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් (02) පොතේ පිටුව 170 ඡේදය 294 යටතේ යොදා ඇති බවත් නිරීක්ෂණය වේ. එසේවුවද වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 196/24 සහ 2024.07.28

දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඔහුගේ ශරීරයේ නළල, පපු ප්‍රදේශය, අත්, උරහිස් ආදී ස්ථානවල සීරීම් තුවාල 17ක් ඇති බවට අධිකරණ වෛද්‍යවරයා සඳහන් කර ඇති අතර, ඒ කිසිදු තුවාලයක් 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් වින්දිත තැනැත්තා පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය නොවීමෙන් 4 වන වගඋත්තරකරු විසින් අදාළ පරීක්ෂා කිරීමෙන් නිසි පරිදි සිදු කළාද යන්න ගැටලු සහගත ය. කෙසේවෙතත් වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අයගේ පාදවල ඉදිමුම් පවතින බවට හඳුනාගෙන සටහන් යොදා තිබුණ ද, වින්දිත තැනැත්තා හට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය ද නැද්ද යන්න සම්බන්ධයෙන් කිසිදු විමසීමක් කර ඇති බව එකී සටහන අනුව නිරීක්ෂණය නොවේ. එසේහෙයින් ඉහතින් සඳහන් කර ඇති පොලීසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීති රීති පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක 'ඒ 20' හි 4 (ඒ) වගන්තියෙහි ඇතුළත් නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය හට නිසි වේලාවේ දී වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව පෙනී යයි.

එසේම, 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර සහ 3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු යන නිලධාරීන් විසින් වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගැනීම සඳහා ඔහුගේ නිවස වෙත ගිය අවස්ථාවේ දී වින්දිත තැනැත්තා නිවසේ අඩි 8ක් පමණ උස බිත්තියකින් පැන දිවගොස් අසල තිබූ කැළෑරොදක වැටී සිට ඇති අතර, එම අවස්ථාවේ දී එම ස්ථානයට වින්දිත තැනැත්තාගේ ඥාතීන් ඒකරාශී වී පොලිස් නිලධාරීන්හට බැන වදිමින් කලබලකාරී වාතාවරණයක් නිර්මාණය කිරීම හේතුවෙන් 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර නිලධාරියා විසින් ඒ පිළිබඳව පොලිස් ස්ථානය වෙත දැන්වීමෙන් පසු පොලිස් ස්ථානය මගින් සිදු කළ දැනුම්දීම මත 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා එම ස්ථානයට ගිය බව කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. ඒ අනුව වින්දිත තැනැත්තා බිම වැටී සිටියදී අත්අඩංගුවට ගත් බව 1 වන වගඋත්තරකරු දුටු බව තහවුරු වේ. එවැනි පසුබිමක් තුළ වින්දිත තැනැත්තාගේ ශරීරයේ පැවති තුවාල සහ අපහසුතාවයන් 1 වන වගඋත්තරකරු හට නිරීක්ෂණය නොවී තිබීමේ හැකියාවක් නැත. වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව ඔහුව පරීක්ෂා කරන ලද 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා විසින් අදාළ සටහන් යොදා ඇත්තේ, 2024.07.27 වන දින පැය 20.00 ට වන අතර, එහිදී 4 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත්තේ "වම් හා දකුණු කකුල්වල ඇස් වටේට පහළ ඉදිමුම් සහිතයි. ඇවිදීමට අපහසු තත්ත්වයක් ඇත. වෙනත් අසනීප තත්ත්වයක් නොමැත. **මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝග ලැබෙන තෙක් සිර මැදිරියේ රඳවා තබමි**" යනුවෙනි. ඒ අනුව වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී එම ස්ථානයේ සිට තිබුණ ද, ඔහුව අත්අඩංගුවට ගෙන ඇති පැය 17.50 සිට 4 වන වගඋත්තරකරු පරීක්ෂා කර බලා සටහන් යෙදූ පැය

20.00 වන විටත් 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා වින්දිත තැනැත්තා හට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සම්බන්ධයෙන් නියෝග ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් වින්දිත තැනැත්තාව රත්නපුර රෝහල වෙත රැගෙන ගොස් ඇත්තේ, අතුඅඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2024.07.28 වන දින පැය 08.30ට බව පොලිස් ස්ථානයේ තොරතුරු පොත් සටහන් අනුව පෙනී යන බැවින් ඒ වන තෙක් වින්දිත තැනැත්තා හට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට අදාළව 1 වන වගඋත්තරකරු අවධානය යොමු කර නොමැති බව පෙනී යයි.

ඒ අනුව පොලීසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීති රීති ඇතුළත් අංක 'ඒ 20' දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව කටයුතු කිරීමට තමා යටතේ සිටින නිලධාරීන් හට නිසි නියෝග සහ උපදෙස් සපයමින්, සිය රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා අපොහොසත්ව ඇත.

තවද, අංක 2747/2023 (අපරාධ චක්‍රලේඛ අංක 02/2023) සහ 2023.03.25 දිනැති පොලිස්පති චක්‍රලේඛයෙහි "පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු නෛතික ප්‍රතිපාදන" ඇතුළත්ව ඇත. එකී චක්‍රලේඛයේ අංක 5.2 යටතේ දක්වා ඇත්තේ **ස්වභාවික රෝගී තත්ත්වයකදී පවා උපරිම උනන්දුව යොදවා සැකකරුගේ ජීවිතය ආරක්ෂා කරගැනීමට නිලධාරීන් ක්‍රියා කළ යුතු බවත්, සැකකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන අවස්ථාවලදී සැකකරුවන් රෝහල්ගත කිරීමට ක්‍රියා කර ඒ පිළිබඳව ළඟම ඥාතීන් දැනුවත් කිරීම අවශ්‍ය වන බවත්** ය. ඉහතින් දක්වා ඇති පරිදි වින්දිත පාර්ශවය හට අත්අඩංගුවටපත් වේලාවේ සිට ඊට පසුදින වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන තෙක් පැය ගණනාවක් බරපතල තුවාල දෙකක් ද සමඟ තුවාල 19ක් ශරීරයේ තිබිය දී වේදනාත්මකව සිටීමට සිදු ව ඇති බව නිරීක්ෂණය වන බැවින්, ඉහත කී අංක 2747/2023 (අපරාධ චක්‍රලේඛ අංක 02/2023) සහ 2023.03.25 දිනැති පොලිස්පති චක්‍රලේඛයෙහි අංක 5.2 ප්‍රතිපාදනය අනුව සැකකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන අවස්ථාවලදී සැකකරුවන් රෝහල්ගත කිරීමට පොලිස් නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතු අතර, ඒ අනුව ක්‍රියා කිරීමට උපසේවය භාරව සිටි 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් සහ 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි යන නිලධාරීන් අපොහොසත්ව ඇත.

පොලිසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීති රීති ඇතුළත් අංක 'ඒ 20' දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝග සහ අංක 2747/2023 (අපරාධ චක්‍රලේඛ අංක 02/2023) සහ 2023.03.25 දිනැති පොලිස්පති චක්‍රලේඛය මඟින් පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු නෛතික ප්‍රතිපාදන දක්වා ඇත්තේ, පොලිස් නිලධාරීන් එකී නෛතික ප්‍රතිපාදනයන්ට

අනුකූලව ක්‍රියා කිරීම තුළින් පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ය. එවැනි පසුබිමක් තුළ පොලිස් නිලධාරීන් විසින් එකී නෛතික ප්‍රතිපාදන නිසි පරිදි අනුගමනය නොකළහොත් එම නෛතික ප්‍රතිපාදනයන්හි රැකවරණය පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන් හට අහිමි වනු ඇත. ඒ අනුව ඉහතින් සඳහන් කර ඇති පරිදි පොලීසියේ ආරක්ෂා භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීති රීති ඇතුළත් අංක 'ඒ 20' දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝග සහ අංක 2747/2023 (අපාරාධ චක්‍රලේඛ අංක 02/2023) සහ 2023.03.25 දිනැති පොලිස්පති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා සහ 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා අපොහොසත්ව ඇති බැවින්, වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අයහට එකී නෛතික ප්‍රතිපාදනයන්ගේ රැකවරණය අහිමිව ඇති බැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අයගේ මූලික අයිතිවාසිකම 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් නිලධාරියා සහ 1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි නිලධාරියා විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, වින්දිත පාර්ශවය වන ඒ.ජී. ජානක කිත්සිරි යන අය අත්අඩංගුවට ගැනීම නීතියට අනුකූලව සිදු කර ඇති බැවින් ද, ඔහු හට 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදු කර ඇති බව තහවුරු නොවන බැවින් ද, මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර උ.පො.ප. ඔබේසේකර සහ 3 වන වගඋත්තරකාර පො.කො. 54287 ළහිරු යන නිලධාරීන් හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

1 වන වගඋත්තරකාර රත්නපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක (හිටපු) ඩබ්.එම්.ඩී. කමල් අබේසිරි සහ 4 වන වගඋත්තරකාර පො.සැ. 35072 රුවන් යන නිලධාරීන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 06 . 25 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා